**රුහුණ විශ්වවිද්‍යාලය - 2012**

**------------------------------**

1. **මූල්‍ය ප්‍රකාශන**

**--------------**

1.1 **තත්ත්වාගණනය කළ මතය**

**---------------------------**

මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2012 දෙසැම්බර් 31 දිනට රුහුණ විශ්වවිද්‍යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ රාජ්‍ය ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**-------------------------------------**

1.2.1 **ගිණුම්කරණ අඩුපාඩු**

**---------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය සතු වාහන 17 ක අගය ප්‍රත්‍යාගණනය කර ගිණුම්වල දක්වා නොතිබූ අතර ඒවායේ සුන්බුන් අගය පමණක් දක්වා තිබුණි. මෙම වාහන අතුරින් වාහන 16 ක වටිනාකම රු.33,000 ක් ලෙස ගිණුම්වලට ඇතුළත්ව තිබුණි. තවද විශ්වවිද්‍යාලය සතු දැනට ධාවනය කෙරෙන හා භාවිත තත්ත්වයේ පවතින බස් රථයක, ගිලන් රථයක, ත්‍රී රෝද රථ 04 ක, යතුරු පැදි 05 ක හා අත් ට්‍රැක්ටරයක හා ටේලරයක වටිනාකම 2012 දෙසැම්බර් 31 දිනට ස්ථාවර වත්කම් ලෙස මෝටර් රථ ගිණුමට ගෙන නොතිබුණි.

(ආ) ආයතනය සතු විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු ව්‍යවහාර මුදලට පරිවර්තනය කිරීමේදී මූල්‍යමය වත්කම් හා වගකීම් ගිණුම්වල ශේෂ, ගිණුම් කාල පරිච්ඡේදය අවසානයේ පවතින විනිමය අනුපාතයට අනුව නැවත පරිවර්තනය කර සිදුවන ලාභ හෝ පාඩු ආදායම් වියදම් ගිණුමට ගැලපිය යුතු වුවත් 2012 දෙසැම්බර් 31 දිනට එසේ හඳුනාගත් පාඩුව රු. 325,722 ක් වූ අතර එය ගිණුම් ගතකර නොතිබුණි. එමෙන්ම එම ගිණුමට අදාලව සමාලෝචිත වර්ෂයේ ආදායම රු.44,185 ක් වුවත් එය රු. 52,915 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් වර්ෂයේ ආදායම රු. 8,730 ක් වැඩියෙන් ගිණුම් ගතකර තිබුණි.

(ඇ) JAICA ව්‍යාපෘතිය මගින් ලැබුණු මයික්‍රෝ බස් රථය සඳහා ආනයනය කිරීමේ දී ගෙවීමට සිදුවූ රු.3,210,395 ක තීරුබදු හා වරාය ගාස්තු පමණක් විශ්වවිද්‍යාලය මගින් ගෙවා තිබුණි. ඒ අනුව වාහනයේ මුළු වටිනාකම (එකතු කළ අගය මත බදු සහිතව) රු.8,400,000 ක් වුවද රු.11,610,395 ක් ලෙස ගිණුම් ගත කිරීමෙන් රු.3,210,395 ක් වූ ආනයන තීරු බදු ගාස්තු දෙවරක් ගිණුම්ගත කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඈ) කෘෂි පීඨයට පවරා තිබුණු ගම් උදාව භූමියේ වැට තැනීම වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණු රු.4,655,664 ක මුදල ඉඩම් ගිණුමට හර කිරීම වෙනුවට ගොඩනැගිලි ගිණුමට හර කර තිබුණි.

(ඉ) විශ්වවිද්‍යාලය සතු ඉඩම් වලින් 1982,1985 හා 2006 වර්ෂවල දී අත්පත් කරගත් පර්චස් 378.3 කින් යුත් ඉඩම් කැබලි 03 ක වටිනාකම තක්සේරු කර ගිණුමට ඇතුළත්කර නොතිබුණි.

(ඊ) මාසිකව සේවක වැටුපෙන් අයකර ගැනීමට නොහැකි වූ ණය ශේෂ අර්ථසාධක අරමුදලින් හෝ අයකර ගැනීමේ බලාපොරොත්තුවෙන් HO 3030 නම් වූ වෙනම ගිණුමක සටහන් කර තිබුණි. මෙම ගිණුමේ ශේෂය රු.3,466,532 ක් විය යුතු වුවත්, එය රු. 3,242,581 ක් සේ සටහන් කර තිබීමෙන් රු. 223,951 ක වෙනසක් නිරීක්ෂණය විය. තවද, මෙම ණය ශේෂයන්, විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදලෙන් අයකර ගැනීමට නියමිත වුවත් 2012 දෙසැම්බර් 31 දිනට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් ගණනයකර එවන ලද අර්ථසාධක අරමුදල් ශේෂ ලැයිස්තුව සමඟ සැසඳීමේ දී සේවකයින් 11 දෙනෙකුගේ අර්ථසාධක අරමුදල් ගිණුම්වල, ශේෂයන් නොමැති බව නිරීක්ෂණය විය. ඒ අනුව ඔවුන්ගෙන් අයවිය යුතුව තිබුණු රු. 385,025 ක මුදල අයකර ගැනීමට මෙතෙක් විකල්ප ක්‍රියාමාර්ගයක්ද ගෙන නොතිබුණු අතර මේ සඳහා පොලී ගණනය කිරීමක් ද සිදුකර නොතිබුණි.

1.2.2 **නොසැසඳූ පාලන ගිණුම්**

**-------------------------**

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලය විසින් පවත්වාගෙන යන ව්‍යාපෘති 10 කට අදාලව උපයෝගී ලේඛන අනුව ශේෂ හා ගිණුම් අනුව ශේෂ අතර රු. 1,427,390 ක වෙනසක් පැවැතුණි.

(ආ) මාපලාන ගොවිපල තුළ නඩත්තු කරන දෛනික බිත්තර ගැනීමේ ලේඛනය හා බිත්තර එලදා ලේඛනය නිසි පරිදි නඩත්තු කර නොතිබුණු අතර එම ලේඛන අතර නිරන්තර වෙනස්කම් දක්නට ලැබුණි. 2012 සැප්තැම්බර් මාසයේ පමණක් එම ලේඛන දෙක අතර බිත්තර 1,764 ක වෙනසක් නිරීක්ෂණය වූ අතර එහි වටිනාකම රු. 26,460 ක් විය.

### 1.2.3 නොපියවූ ගිණුම්

වර්ෂ 03 කට පෙර ව්‍යාපෘති 03 ක් සඳහා ලබා දී තිබූ රු. 109,414 ක අත්තිකාරම් හා 2012 වර්ෂයේ දී නිලධාරීන් 06 දෙනෙකුට සහ ආයතනයකට ලබා දී තිබූ රු.151,392 ක අත්තිකාරම් 2012 දෙසැම්බර් 31 දක්වාම නිරවුල් කර නොතිබුණි.

### 1.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

අවසන් ගිණුම් උපලේඛනය හා අධ්‍යයන ආයතන අංශය විසින් ඉදිරිපත් කරන ලද උපලේඛනය අනුව ගිවිසුම් උල්ලංඝනය කරන ලද ආචාර්යවරුන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට අය වී ඇති මුදල හා අයවියයුතු මුදල අතර පිළිවෙලින් රු.3,247,201 ක හා රු.3,073,555 ක වෙනසක් නිරීක්ෂණය විය.

| පීඨය | ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබුණු මුදල | | | ගිවිසුම් කඩ කළ ආචාර්යවරුන්ගෙන් 2012 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු මුදල | | |
|---|---|---|---|---|---|---|
| | ආයතන අධ්‍යයන අංශයේ උපලේඛන අනුව ශේෂය | අවසන් ගිණුම් උපලේඛනය අනුව ශේෂය | වෙනස | ආයතන අධ්‍යයන අංශයේ උපලේඛන අනුව ශේෂය | අවසන් ගිණුම් උපලේඛනය අනුව ශේෂය | වෙනස |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| විද්‍යා පීඨය | 739,383 | 1,604,682 | 865,299 | 1,252,726 | 989,043 | 263,683 |
| ඉංජිනේරු පීඨය | 2,774,582 | 4,508,926 | 1,734,344 | 1,339,780 | 1,205,684 | 134,096 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | - | 645,268 | 645,268 | - | - | - |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | | | | 751,185 | 2,520,319 | 1,769,134 |
| ධීවර හා සාගරවිද්‍යා හා තාක්ෂණ පීඨය | | | | 5,464,416 | 5,460,538 | 3,878 |
| කෘෂි විද්‍යා පීඨය | | | | 186,858 | - | 186,858 |
| එකතුව | | | 3,247,911 | | | 2,357,649 |

### 1.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2012 දෙසැම්බර් 31 දිනට මාපලාන ගොවිපල සතු ජීව තොගයේ වටිනාකම රු.1,779,000 ක් ලෙස තක්සේරුකර තිබුණත් ගොවිපල සතු සත්ව ලේඛන නිවැරදිව නඩත්තු නොකිරීම නිසා එම ජීව තොගයේ වටිනාකම නිවැරදිව ගණනය කිරීමට නොහැකි විය. තවද ගොවිපල සතු සියළුම තොග මූල්‍ය ප්‍රකාශන තුළ අන්තර්ගත කළයුතු වුවත් එදිනට ගොවිපල වෙළඳසැලෙහි පැවති නිෂ්පාදනවල වටිනාකම මූල්‍ය ප්‍රකාශනවල අවසන් තොගය තුළ දක්වා නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය තුළ මිළ දී ගෙන තිබුණුරු.2,454,406 ක් වටිනා සත්ව ආහාර සහරු.44,828 ක් වටිනා සත්ව බෙහෙත් තොගයේ අවසාන තොග වටිනාකම පිළිබඳ තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුල දක්වා නොතිබුණි.

(ආ) විශ්වවිද්‍යාලය සතු සියළුම ස්ථාවර වත්කම් ඇතුළත් වන පරිදි විධිමත්ව පිළියෙල කරන ලද ස්ථාවර වත්කම් ලේඛනයක් විගණනයට ඉදිරිපත්කර නොතිබුණි.

### 1.2.6 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | විස්තරය |
|---|---|
| (අ) විශ්වවිද්‍යාලපනතේ45(2)(1) (i) වගන්තිය හා 1999 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ (2) වගන්තිය | ඉහත වගන්තිය හා චක්‍රලේඛ විධිවිධාන වලට පටහැනිව දුරස්ථ හා අඛණ්ඩ අධ්‍යාපන ඒකකයේ ප්‍රථම ශාස්ත්‍ර පරීක්ෂණයේ (2010) ලකුණු නිරවද්‍යතාවය පරීක්ෂාව වෙනුවෙන් එම ඒකකයේ අධ්‍යක්ෂ, ජ්‍යෙෂ්ඨ සහකාර ලේඛකාධිකාරී ඇතුළු ආචාර්යවරුන් 14 දෙනෙකු වෙනුවෙන් රු. 333,625 ක දීමනාවක් සනාථන සභාවේ අනුමැතිය මත පමණක් ගෙවා තිබුණි. |
| (ආ) 1971අංක 08 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත හා 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් පනත | කෘෂි විද්‍යා පීඨයෙහි ගොවිපොල කම්කරුවන් 08 දෙනෙකු සඳහා 2011 දෙසැම්බර් සිට 2012 ජුලි දක්වා සහ වෛද්‍ය පීඨයෙහි නිලධාරීන් 08 දෙනෙකු සඳහා 2012 ජුලි සිට නොවැම්බර් මස දක්වා සේවක අර්ථසාධක අරමුදල් දායකය ලෙස රු. 338,400 ක් සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල් දායකය ලෙස රු.55,260 |

ක් ගෙවිය යුතු වුවත් එසේ ගෙවා නොතිබුණි.

| | |
|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය xix පරිච්ඡේදයේ 5.2 හා 5.6 වගන්ති | ස්ථිර නිවාසවල පදිංචි විවාහක නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 12.5 ක් ද, අවිවාහක නිලධාරීන්ගේ වැටුපෙන් සියයට 7.5 ක් ද අයකළයුතු අතර, එසේ නොමැතිව ස්ථිර කුලියක් අයකරන්නේ නම් ප්‍රධාන තක්සේරුකරුගෙන් තක්සේරු වාර්තාවක් ලබාගෙනඒ සඳහා අමාත්‍යාංශ ලේකම්වරයාගේ අනුමැතියද ලබාගතයුතු වුවත් නිල නිවාසවල පදිංචි විශ්වවිද්‍යාල කාර්යමණ්ඩලයෙන් ස්ථිර නිවාස කුලියක් අයකිරීම නිසා 2012 වර්ෂය තුළ රු. 3,103,188 ක පමණ පාඩුවක් විශ්වවිද්‍යාල අරමුදලට සිදුවී තිබුණි.තවද නිවාස යම් කාල පරිච්ඡේදයකට පමණක් ලබා දිය යුතු වුවද, නිවාසවල පදිංචිකරුවන් දිගුකාලීනව සිටීමත්, නිවාස ඉල්ලුම්පත්ලාභීන්ගේ පොරොත්තු ලේඛනයක් පවත්වා ගෙන නොයැමත් නිසා නිවාස ලබා දෙන්නේ කුමන පදනමක් මතද යන්න පැහැදිළි නොවීය. |
| (ඈ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 570 හා 571 | 2012 දෙසැම්බර් 31 දිනට වර්ෂ 02 ක කාලය ඉකුත්ව තිබුණු රු.9,352,916 ක් වූ තැන්පතු සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි පරිදි කටයුතු කර නොතිබුණි. |

## 2 මූල්‍ය සමාලෝචනය

-------------------------

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විශ්වවිද්‍යාලයේ මෙහෙයුම් කටයුතුවලින් රු. 1,431,816,000 ක ඌනතාවයක් වූ අතර පුනරාවර්තන වියදම් සඳහා රජයෙන් ලැබුණු රු. 1,544,148,000 ක ප්‍රදානය හේතු කොට ගෙනරු.112,332,000 ක අතිරික්තයක් වී තිබුණි.ඉකුත් වර්ෂයේ රජයේ ප්‍රදාන ගණනේ ගැනීමට පෙර ඌනතාවය රු. 1,202,969,000 ක් වූ අතර එම වර්ෂයේ පුනරාවර්තන වියදම් සඳහා වූ රු.1,466,916,000 ක රජයේ ප්‍රදානය හේතු කොට ගෙන රු. 263,947,000 ක අතිරික්තයක් වී තිබුණි. ඉකුත් වර්ෂයට වඩා සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු. 151,615,000 කින් අඩු වී තිබුණි.

## 2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ආදායම් වියදම් සාරාංශයක් පහත දැක්වේ

| විස්තරය | 2012 | 2011 | වැඩි/අඩු වීම | වැඩි/අඩු වීමේ ප්‍රතිශතය |
|---|---|---|---|---|
| | (රු.000) | (රු.000) | (රු.000) | |
| ආදායම | 67,065 | 78,607 | (11,542) | (14.7) |
| වියදම (ක්ෂය හැර) | 1,498,881 | 1,281,576 | 217,305 | 16.9 |
| ඌනතාවය | 1,431,816 | 1,202,969 | 228,847 | 19.0 |
| රජයේ ප්‍රදාන | 1,544,148 | 1,466,916 | 77,232 | 5.3 |
| රජයේ ප්‍රදාන වලින් පසු අතිරික්තය (ක්ෂය කිරීම් වලට පෙර) | 112,332 | 263,947 | (151,615) | (57.4) |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරණු ලැබේ.

(අ) 2011 වර්ෂයට සාපේක්ෂව ආදායම අඩු වි තිබූ අතර ඒසඳහා මාපලාන ගොවිපොලේ ආදායම රු.2,731,000 කින් හා බාහිර පාඨමාලා ආදායම රු. 11,275,000 කින් අඩු වීම හේතු වී තිබුණි. එහෙත් විවිධ ආදායම් රු. 2,745,000 කින් වැඩි වී තිබුණි.

(ආ) වියදම් 2011 ට සාපේක්ෂව රු. 217,305,000 කින් ඉහළ ගොස් තිබුණු අතර ඒ සඳහා වැටුප් වියදමරු. 188,933,000 කින් ද, සැපයීම් හා පාරිභෝගික ද්‍රව්‍ය වියදම රු.13,002,000කින් සහ නඩත්තු හා ගිවිසුම්ගත සේවා වියදම රු. 19,387,000 කින් ද වැඩි වීම හේතු වී තිබුණි.

(ඇ) ප්‍රාග්ධන කාර්යයන් සඳහා ගෙවන ලද අත්තිකාරම් 2012 වර්ෂය තුළ සියයට 249 කින් ඉහළ ගොස් තිබූ අතර ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨය වෙනුවෙන් පර්යේෂණ යාත්‍රාවක් මිළ දී ගැනීම සඳහා රු. 17,338,186 ක මුදලක් අත්තිකාරම් වශයෙන් ගෙවා තිබීම ඊට හේතු වී තිබුණි.

(ඇ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු විෂයයන් සියයට 32 කින් ඉහළ ගොස් ඇත්තේ ප්‍රවාහන වියදම් අත්තිකාරම් හා ලැබිය යුතු ජාත්‍යන්තර පර්යේෂණ අත්තිකාරම් ඉහළ යාම හේතුවෙනි. අධ්‍යයන නිවාඩු ලබා විදේශ ගතවන ආචාර්යවරුන් වෙත (විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රතිපූරණය මත) ලබා දෙන විදේශ ගමන් ටිකට් පත් සඳහා යන වියදම් 2013 මැයි 09 දින දක්වා ප්‍රතිපූරණය වී නොතිබීම මත මෙම ශේෂය ගොඩනැගී තිබුණි.

(ඉ) නව ව්‍යාපෘතිවලට හා Green Dyke ව්‍යාපෘතියට මෙම වර්ෂය තුළ දී මුදල් ලැබීම හේතුවෙන්ත්‍යාග හා පරිත්‍යාග ශේෂය සියයට 56 කින් ඉහළ ගොස් තිබුණි.

(ඊ) ප්‍රධාන කාර්යාලයට මිළ දී ගත් තොගය සියයට 58 කින් හා ඉංජිනේරු පීඨයට මිළ දී ගත් තොගය සියයට 183 කින් වැඩිවීම හේතුවෙන්ඉතිරි තොගය සියයට 38 කින් ඉහළ ගොස් තිබුණි.

## 2.3 ආයතනයට එරෙහිව හෝ ආයතනය විසින් ආරම්භකර ඇති නෛතික කටයුතු

(අ) ගිවිසුම් ප්‍රකාරව කටයුතු නොකිරීම, පාලක සභා හා අභියාචන මණ්ඩලවල තීරණවලට එරෙහිව, සේවක අර්ථසාධක අරමුදල් දායකය නොගෙවීම , පාලක සභාව විසින් ගන්නා ලද තීන්දු ආදිය සම්බන්ධයෙන් රු.32,972,272 ක වන්දි ඉල්ලා විශ්වවිද්‍යාලයට එරෙහිව නඩු 18 ක් අධිකරණවල ගොනුකර තිබුණි.

(ආ) ආධුනික කථිකාචාර්යවරයකු මූල්‍යාමය වරදකට සේවයෙන් පහකිරීම හේතුවෙන් අභියාචනාධිකරණය දුන් තීරණයකට එරෙහිව විශ්වවිද්‍යාලය විසින් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගොනුකර තිබුණි.

## 2.4 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

2011 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේ දී ජංගම වත්කම් ප්‍රමාණය සියයට 26 කින් අඩුවීම හා ජංගම වගකීම් ප්‍රමාණය සියයට 60 කින් ඉහළ යාම නිසා ජංගම අනුපාතය 3.13 සිට 1.45 දක්වාත් ක්ෂණික අනුපාතය 2.98 සිට 1.32 දක්වාත් අඩු වී තිබුණි.

## 3 මෙහෙයුම් සමාලෝචනය

### 3.1 කාර්ය සාධනය

#### 3.1.1 අධ්‍යයන කටයුතු

සමාලෝචිත වර්ෂයේ විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතු සම්බන්ධ වැදගත් දත්ත කිහිපයක් පහත දැක්වේ.

| පවත්වා ඇති උපාධි පාඨමාලාව | පාඨමාලා සංඛ්‍යාව | වර්ෂය තුළ උපාධි පරීක්ෂණයට පෙනී සිටි සංඛ්‍යාව | වර්ෂය තුළ බිහි වූ උපාධිධාරින් සංඛ්‍යාව | අසමත් / ඌන සාමාර්ථ ලද සිසුන් සංඛ්‍යාව | වර්ෂය තුළ බඳවාගත් නවක සිසුන් සංඛ්‍යාව | වර්ෂය අවසානයට සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | වර්ෂය සඳහා වූ ඒක ශිෂ්‍ය පිරිවැය |
|---|---|---|---|---|---|---|---|
| | | | | | | | රු. |
| ශාස්ත්‍රවේදී | 13 | 529 | 509 | 20 | 660 | 1,511 | 121,857 |
| ව්‍යාපාර පරිපාලනවේදී | 03 | 279 | 245 | 34 | 320 | 1,262 | 49,658 |
| විද්‍යාවේදි | 08 | 251 | 170 | 81 | 222 | 936 | 196,612 |
| කෘෂිකර්ම විද්‍යාවේදී | 07 | 160 | 110 | 50 | 251 | 519 | 259,853 |
| වෛද්‍යවේදී | 15 | 156 | 121 | 35 | 242 | 1,005 | 255,388 |
| ඉංජිනේරු විද්‍යාවේදී | 03 | 197 | 188 | 09 | 252 | 790 | 141,076 |
| ධීවර හා සාගර විද්‍යාවේදී | 03 | 32 | 22 | 10 | 50 | 162 | 209,521 |

විද්‍යා පීඨයෙහි , කෘෂි විද්‍යා පීඨයෙහි හා ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයෙහි විභාග අසමත්වීමේ සංඛ්‍යාව පිළිවලින් සියයට 32 ක් , සියයට 31 ක්, හා සියයට 31 ක් වශයෙන් විය.

ඒ අනුව සමස්ථ විභාග අපේක්ෂකයින් ගෙන් 1/3 කට ආසන්න ප්‍රමාණයක් විභාගය අසමත් වී ඇති බව නිරීක්ෂණය විය.

## 3.1.2 ඉකුත් වර්ෂයට සාපේක්ෂව ඒක ශිෂ්‍ය පිරිවැය

| පීඨය | 2012 මුළු පිරිවැය | 2012 සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | 2012 ඒක ශිෂ්‍ය පිරිවැය | 2011 මුළු පිරිවැය | 2011 සමස්ථ ශිෂ්‍ය සංඛ්‍යාව | 2011 ඒක ශිෂ්‍ය පිරිවැය | ඒක ශිෂ්‍ය පිරිවැයෙහි විචලනයන් (වැඩිවීම) |
|---|---|---|---|---|---|---|---|
| | රු. | | රු. | රු. | | රු. | % |
| මානව ශාස්ත්‍ර | 184,125,286 | 1,511 | 121,857 | 149,230,838 | 1,532 | 97,409 | 25 |
| කළමනාකරණ හා මූල්‍ය | 62,668,710 | 1,262 | 49,658 | 48,668,440 | 1,575 | 30,900 | 60 |
| විද්‍යා | 184,028,885 | 936 | 196,612 | 159,669,039 | 1,184 | 134,855 | 46 |
| කෘෂිවිද්‍යා | 134,863,916 | 519 | 259,853 | 111,059,808 | 566 | 196,219 | 32 |
| වෛද්‍ය | 246,615,373 | 1,005 | 245,388 | 183,805,447 | 995 | 184,729 | 33 |
| ඉංජිනේරු | 111,450,213 | 790 | 141,076 | 91,873,018 | 789 | 116,442 | 21 |
| ධීවර හා සාගර විද්‍යා | 33,942,389 | 162 | 209,521 | 29,092,671 | 165 | 176,319 | 19 |
| පශ්චාත් උපාධි | 2,520,895 | - | - | - | - | - | - |

වැඩිම ඒක ශිෂ්‍ය පිරිවැයක් දරන කෘෂි විද්‍යා පීඨය අඩුම ඒක ශිෂ්‍ය පිරිවැයක් දරන කළමනාකරණ හා මූල්‍ය පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැය සමඟ සැසැඳීමේ දී සියයට 423 ක ඉහළ ප්‍රතිශතයක් ගෙන තිබුණි. මෙය ඉංජිනේරු පීඨයේ ඒක ශිෂ්‍ය පිරිවැයද ඉක්මවා සියයට 84 ක පමණ ඉහළ අගයකි. සමස්ථයක් වශයෙන් සියළුම පීඨවල ඒක ශිෂ්‍ය පිරිවැයෙහි වැඩිවීමක් දක්නට ලැබුණි.

## 3.1.3 අධ්‍යයන කාර්යමණ්ඩලය අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබා ගැනීම

විශ්වවිද්‍යාලය තුළ සිටින සමස්ත අධ්‍යයන කාර්යමණ්ඩලය 448 ක් විය. 2012 අධ්‍යයන වර්ෂය තුළ දී ඉන් 101 දෙනෙකු අධ්‍යයන නිවාඩු ලබා සිටි අතර, 27 දෙනෙකු සප්ත

වාර්ෂික නිවාඩු ලබා සිටියහ. ඒ අනුව සමස්ත අධ්‍යයන කාර්යමණ්ඩලයෙන් සියයට 29 ක් පමණ අධ්‍යයන හා සප්තවාර්ෂික නිවාඩු ලබා තිබුණි.
මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) විශ්වවිද්‍යාලයේ අධ්‍යයන කටයුතුවලට අවහිරයක් නොවන පරිදි අඛණ්ඩව පවත්වාගෙන යාමට හැකිවන ලෙස ආචාර්යවරුන් සඳහා අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු අනුමත කළයුතු වුවත් බොහෝ අවස්ථාවල අධ්‍යයනාංශවල සිටින අධ්‍යයන කාර්යමණ්ඩලයෙන් සියයට 50 කට වඩා වැඩි පිරිසකට අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු අනුමත කර තිබුණි. මීට අමතරව සමහර අධ්‍යයනාංශවල මෙම තත්ත්වය සියයට 80 මට්ටම ඉක්මවා තිබුණි.

උදා:- * පාංශු විද්‍යා අධ්‍යයනාංශයේ සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය 06 ක් වූ අතර ඉන් 05 දෙනෙකු අධ්‍යයන නිවාඩු ලබා තිබුණි.

* වෛද්‍ය පීඨයේ භිෂග්වේදය අධ්‍යයනාංශයේ සිටින අධ්‍යයන කාර්ය මණ්ඩලය 05 ක් වූ අතර ඉන් 03 දෙනෙකු අධ්‍යයන නිවාඩු හා 01 අයෙකු සප්තවාර්ෂික නිවාඩු ලබා තිබුණි.

(ආ) අධ්‍යයන කාර්යමණ්ඩලය සඳහා පාලනයකින් තොරව අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබා දීම මත එම දේශකවරුන්ගේ දේශන පැය ආවරණය කිරීම වෙනුවෙන් බාහිර දේශකයින් බඳවා ගැනීමට සිදුවී තිබුණි. ඒ අනුව අධ්‍යයනාංශ 04 ක් සඳහා පමණක් බාහිර දේශන ගාස්තු වෙනුවෙන් රු. 2,260,500 ක ( ගමන් වියදම් හැර ) මුදලක් 2012 වර්ෂය තුළදී දැරීමට සිදු වී තිබුණි.

(ඇ) නියැදි පරීක්ෂණයට අනුව පීඨ 05 කට අයත් අධ්‍යයනාංශ 07 ක කථිකාචාර්යවරු 47 දෙනෙකු 2011/2012 අධ්‍යයන වර්ෂයේ දේශන පැය 4,277 ක් පවත්වා තිබුණි. මේ අතුරින් කථිකාචාර්යවරු 14 දෙනෙකු දේශන පැය 651 ක් පවත්වා තිබූ අතර එය සතියකට පැය 1.9 ක සාමාන්‍ය අගයක්ව පැවතුණි.

(ඈ) වෛද්‍ය පීඨයේ ශෛල්‍ය වෛද්‍ය විද්‍යා අධ්‍යයනාංශයේ විෂයයන් 04 කට අදාලව අනුමත දේශන පැය 16 ම පවත්වා නොතිබුණි.

## 3.2 අරමුදල් ඌන උපයෝජනය

විශ්වවිද්‍යාලයේ ක්‍රියාත්මක වන පර්යේෂණ ව්‍යාපෘති අතුරෙන් ව්‍යාපෘති 17 ක් 2012 වර්ෂය තුළ ක්‍රියාත්මක නොවීම නිසා එම ව්‍යාපෘතිවලට වෙන්කල රු. 3,409,451 ක මුදලක් නිශ්ක්‍රියව පැවති අතර රු.4,844,945 ක මුදලක් වෙන්කර තිබූ ව්‍යාපෘති 05 කින් සමාලෝචිත වර්ෂය තුළ වියදම් කර තිබුණේ රු. 17,116 ක් පමණි.

**3.3 නිෂ්ක්‍රිය ඌන උපයෝජිත වත්කම්**

අවශ්‍යතාවයන් හඳුනා නොගෙන ගබඩා තොග මිළ දී ගැනීම හේතුවෙන් රු. 338,037 ක් වටිනා තොග ප්‍රධාන ගබඩාවේ ද, රු. 245,796 ක් වටිනා තොග කෘෂි විද්‍යා පීඨයෙහිද දීර්ඝ කාලයක සිට නිකුත් නොවී පැවතුණි.

**3.4 ආර්ථික නොවූ ගනුදෙනු**

සිදු වූ අක්‍රමිකතාවයක් පිළිබඳ වැඩ තහනමකට ලක්ව විනය පරීක්ෂණයකට යොමුකර තිබුණු නිලධාරියකුගේ පරීක්ෂණය අවසන් කිරීමට වර්ෂ 02 ක පමණ කාලයක් ගතකර තිබූ අතර, එම කාලය තුළ දී ඔහුගේ විශ්‍රාම යෑමේ ඉල්ලීම භාර ගැනීම නිසා පාරිතෝෂික මුදල නිදහස් කිරීමේ දී රු. 100,710 ක අධිභාර මුදලක් ගෙවීම් කර තිබුණි.

**3.5 කාර්ය මණ්ඩල පරිපාලනය**

| අංශය / පීඨය | මාණ්ඩලික | | මාණ්ඩලික නොවන | | සුළු සේවක | | පුරප්පාඩු/ (අතිරික්ත) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | අනුමත | තථ්‍ය | අනුමත | තථ්‍ය | අනුමත | තථ්‍ය | මාණ්ඩලික | මාණ්ඩලික නොවන | සුළු සේවක |
| පාලන අංශය | 32 | 19 | 155 | 101 | 256 | 132 | 13 | 54 | 124 |
| පශ්චාත් උපාධි පීඨය | 01 | 01 | 02 | 01 | 01 | - | - | 01 | 01 |
| මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය | 01 | 01 | 23 | 23 | 13 | 16 | - | - | (03) |
| කළමනාකරණ හා මූල්‍ය පීඨය | 01 | 01 | 10 | 06 | 07 | 08 | - | 04 | (01) |

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| විද්‍යා පීඨය | 01 | 01 | 33 | 32 | 49 | 42 | - | 01 | 07 |
| වෛද්‍ය පීඨය | 02 | 01 | 94 | 93 | 74 | 92 | 01 | 01 | (18) |
| ඉංජිනේරු පීඨය | 04 | 03 | 50 | 46 | 43 | 55 | 01 | 04 | (12) |
| කෘෂි විද්‍යා පීඨය | 04 | 03 | 24 | 33 | 60 | 68 | 01 | (09) | (08) |
| | ----- | ----- | ---- | ----- | ----- | ----- | ---- | ---- | ----- |
| | 46 | 30 | 391 | 335 | 503 | 413 | 16 | 56 | 90 |
| | === | === | === | === | === | === | === | === | === |

### 3.6 වාහන උපයෝජනය

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කෘෂි පීඨයේ හා ඉංජිනේරු පීඨයෙහි වාහන 02 ක් ඌණ උපයෝජිතව තිබියදී කුලී වාහන ලබා ගෙන පිළිවෙලින් රු.58,390 ක් හා රු.370,900ක් ගෙවා තිබුණි.තවද රියදුරන් සඳහා නිවාඩු අනුමත කිරීමේ දී සේවා අවශ්‍යතාවය පිළිබඳ සලකා බැලීමකින් තොරව එකවර නිවාඩු අනුමතකර තිබුණි. වැල්ලමඩම ප්‍රධාන කාර්යාලයේ රියදුරන් සේවයේ යොදවා ගැනීමකින් තොරව නිෂ්කාර්යව කාලය ගෙවීමට ඉඩප්‍රස්ථා ලබා දී තිබුණි.

(ආ) කෘෂි විද්‍යා පීඨයෙහි කැබ් රථය 2010 මැයි 05 දින සිට ධාවනයෙන් ඉවත්කොට තිබුණු අතර අළුත්වැඩියා කිරීමට කටයුතු ආරම්භ කර වසර 2 ½ ක පමණ කාලයක් ගතකර තිබුණද, එය අළුත්වැඩියා කිරීමට පාලනාධිකාරිය තීරණය නොකිරීම හේතුවෙන් එය නිෂ්කාර්යව පැවතුණි.

(ඇ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව හා උසස් අධ්‍යාපනය සඳහා වූ ආයතන සංග්‍රහයේ xxvii වන පරිච්ඡේදයේ 08 වගන්තිය ප්‍රකාරව සෑම නිල වාහනයකම ඉන්ධන දහනය පරීක්ෂාව සිදු කළයුතු බව දක්වා තිබුණත් විශ්වවිද්‍යාලය සතු වාහන සම්බන්ධයෙන් එම පරීක්ෂාව සිදුකර නොතිබූ අතර, විවිධ අගයන් යටතේ ඉන්ධන තුලනය කර තිබුණි. තවද පොදු 268 ආකෘතියේ වූ ධාවන සටහන් පිටුපස යෙදිය යුතු කිසිදු තොරතුරක් දක්වා නොතිබුණි. මීට අමතරව වාහන ලේඛනයක්, වාහන අළුත්වැඩියා ලේඛනයක් පවත්වා නොතිබුණි.

(ඈ) මුදල් රෙගුලාසි 110 ප්‍රකාරව හානී හා පාඩු ලේඛනයේ වාහන අනතුරු සටහන් කිරීම හාවාහන අනතුරු සම්බන්ධයෙන් විගණකාධිපතිට වාර්තා කිරීමත් සිදුකර නොතිබුණි.

(ඉ) මුදල් රෙගුලාසි 1646 ප්‍රකාරව වාහන පිළිබඳ දෛනික ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා අදාල මාසයට පසු මාසයේ 15 දිනට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත් විශ්වවිද්‍යාලය සතු වාහන 49 න් 45 ක් වෙනුවෙන් නියමිත පරිදි සම්පූර්ණ කරන ලද ධාවන සටහන් හා මාසික සංසිද්ධි වාර්තා ඉදිරිපත් කර නොතිබුණි.

## 4 ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

### 4.1 සංයුක්ත සැලැස්ම - 2011 - 2015

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) කළමනාකරණ හා මූල්‍ය පීඨයේ 2012 අධ්‍යයන වර්ෂය තුළදී අධ්‍යයන ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම ඉලක්ක කරමින් දැනට තිබෙන පාඨමාලාවලට අමතරව ව්‍යාපාර පරිපාලනවේදී විශේෂ උපාධි පාඨමාලාවක් හා පළාත් පාලනය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවක් ආරම්භකරන බව දක්වා තිබුණද, එම ඉලක්කයන් ඉටුකර ගැනීමට 2012 අධ්‍යයන වර්ෂය තුළදී අපොහොසත්ව තිබුණි.

(ආ) කෘෂි විද්‍යා පීඨයේ 2012 අධ්‍යයන වර්ෂය තුළදී අධ්‍යයන ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම ඉලක්ක කරමින් දැනට තිබෙන පාඨමාලාවලට අමතරව ආහාර තාක්ෂණය පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් හා ආරක්ෂාකාරී කෘෂිකර්මය හා භූ දර්ශන කළමණාකරණය යන පාඨමාලා ආරම්භකරන බව දක්වා තිබුණද එය ඉටුකරගෙන නොතිබුණි.

(ඇ) ධීවර සහ සාගර විද්‍යා හා තාක්ෂණ පීඨයේ අධ්‍යයන ප්‍රවේශ අවස්ථා වැඩිකිරීම ඉලක්ක කරමින් නව පශ්චාත් උපාධි පාඨමාලාවක් ආරම්භ කිරීම, සියළුම ආචාර්යවරුන්ට ලැප්ටොප් පරිගණක ලබාදීම, ශ්‍රී ලංකා නාවික හමුදාව සමග එක්ව උපාධි වැඩ සටහන් 03ක් ආරම්භ කිරීම, කිමිදුම් පිහිනුම් ආදී පාඨමාලා 03ක් ආරම්භ කිරීම, භාෂා ඉගැන්වීම් ඒකකයක් පිහිටුවීම, බහු සංස්කෘතික පාඨමාලා ආරම්භ කිරීම, පීඨ සංවර්ධන අරමුදලක් හා දෙපාර්තමේන්තු සංවර්ධන අරමුදලක් පිහිටුවීම යන අරමුණු 2012 වර්ෂයේ දී ඉටුකර ගැනීමට ඉලක්ක කළද එම ඉලක්ක කරා ළඟා වී නොතිබුණි.

(ඈ) මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය, ඉංජිනේරු පීඨය හා වෛද්‍ය පීඨයේ ඉලක්කයන් සපුරා ගැනීමට බලාපොරොත්තුවන කාල පරාසයක් නිශ්චිතව දක්වා නොතිබුණි.

**4.2 විගණන කමිටු**

සමාලෝචිත වර්ෂය තුළ විගණන කමිටුව වාර 04 ක දී රැස්වී තිබුණු අතර, විගණන කමිටුවේදී ගන්නා වූ තීරණවලින් ඇතැම් තීරණ ක්‍රියාත්මක නොවන තත්ත්වයක් නිරීක්ෂණය විය.

**4.3 ප්‍රසම්පාදන සැලැස්ම**

සමාලෝචිත වර්ෂය වෙනුවෙන් ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**4.4 අයවැය ලේඛනමය පාලනය**

අයවැය ලේඛනය පිළියෙල කිරීමේදී සංයුක්ත සැලැස්ම කෙරෙහි අවධානය යොමුකර නොතිබුණු බව නිරීක්ෂණය විය. තවද සංයුක්ත සැලැස්මේ ඇතැම් මූල්‍යාමය දත්ත ඇතුළත්කර නොතිබීම නිසා අය වැය ලේඛනය සමග සැසඳීමට නොහැකි විය.

**4.5 වාර්ෂික වාර්තා සභාගත කිරීම**

2011 වර්ෂයේ වාර්ෂික වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

**4.6 නොවිසඳී ඇති විගණන ඡේද පිළිබඳ නිරීක්ෂණ**

පාර්ලිමේන්තුවේ පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව විසින් සාකච්ඡාකර ඉටුකරන ලෙස නියෝග කර තිබුණද පහත සඳහන් නියෝග 2013 මැයි 09 දින වන විටත් ඉටු කර නොතිබුණි.

| විමසුමට භාජනය කළ කරුණු | දුන් නියෝගය | වර්තමාන තත්ත්වය |
|---|---|---|

| | | |
|---|---|---|
| නිල නිවාසවල පදිංචි වී සිටින නිලධාරීන්ගෙන් ආයතන සංග්‍රහය පරිදි ආර්ථික කුලියක් අය කිරීමෙන් තොරව රු.600, රු.350, රු.200, රු.150 හා රු.100 වශයෙන් විවිධ ප්‍රමාණයන්ගෙන් නිවාස කුලී අය කිරීම. | රජයේ ආයතන සංග්‍රහය පරිදි කාර්යමණ්ඩල නිවාස කුලී අයකිරීමේදී ආර්ථික කුලියක් අයකළ යුතු බව. | 2013 මැයි 09 දින වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. |
| ස්ථාවර වත්කම් ලේඛනය සැකසීම සඳහා 2005 වර්ෂයේ දී නිලධාරියෙකු බඳවා ගෙන තිබියදීම එම කාර්ය සඳහාම සප්තවාර්ෂික නිවාඩු ලබා ගෙන සිටි නිලධාරියෙක නියෝජ්‍ය මූල්‍යාධිකාරී නම් තනතුරකට බඳවා ගෙන වැටුප් ගෙවා තිබුණද ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන නොකිරීම. | ස්ථාවර වත්කම් ලේඛනය කඩිනමින් යාවත්කාලීන කළයුතු බව. | 2013 මැයි 09 දින වන විටත් ස්ථාවර වත්කම් ලේඛනය සම්පූර්ණයෙන් යාවත්කාලීන කර නොතිබුණි. |
| අධ්‍යයන කාර්ය මණ්ඩලය සඳහා පාලනයකින් තොරව අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබා දීම හා එම විෂය නිර්දේශයන් ආවරණය කිරීම සඳහා බාහිර දේශකයන් බඳවා ගැනීම. | අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු අවශ්‍ය අයට ලබා දීමේදී එම අධ්‍යයන අංශය තුළ සිටින කාර්යමණ්ඩලයෙන් විෂය නිර්දේශයන් ආවරණය කර ගැනීමට අංශ ප්‍රධානීන් වගබලා ගතයුතු බව | සමාලෝචිත වර්ෂයේද පාලනයකින් තොරව අධ්‍යයන කාර්යමණ්ඩලය අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබා දීම හා එම විෂය නිර්දේශයන් ආවරණය කිරීම වෙනුවෙන් බාහිර දේශකයන් බඳවා ගෙන තිබුණි. |

## 5. පද්ධති හා පාලනයන්

පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් පිළිබඳව අනාවරණය වූ දුර්වලතා වරින් වර විගණන විමසුම් මගින් විශ්වවිද්‍යාලයේ අවධානයට යොමු කරන ලද අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතු වේ.

-

(අ). වාහන පාලනය

(ආ). නිවාස කුලී අයකිරීම

(ඇ). අධ්‍යයන නිවාඩු ලැබ විදේශගත වී ආපසු නොපැමිණෙන ආචාර්යවරුන් සම්බන්ධයෙන් ගිවිසුම ප්‍රකාරව කටයුතු කර මුදල් අයකර ගැනීම.

(ඈ). අධ්‍යයන හා සප්ත වාර්ෂික නිවාඩු ලබාදීම.